සැ. යු.- 2016.03.04 දින පළ වූ අංක 1957 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,958 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 668 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 682 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 685 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 01 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මාර්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රු.11,730 - 10 x120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (ආරම්භක වැටුප් පියවර) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතු ය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා උපරිම වයස් සීමාවක් බල පවත්වන්නේ නැත)

(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

(iii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්දහිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතිකයකින් සනාථ විය යුතුය.)

(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.

(vii) රජයේ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුයි.

(viii) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ix) අයදුම්කරුවන් ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම සපුරා තිබිය යුතුයි.

(x) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05ක සේවා කාලයක් තුළ පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(xi) පළාත් රාජ්‍ය සේවය හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් තනතුරට අදාළ පළපුරුද්දක් හෝ පුහුණුවක් හෝ ලබා තිබේනම් එය විශේෂ පුහුණුවක් වශයෙන් සලකනු ලැබේ.

03. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iii) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලටද, රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.

(iv) සේවයට බැඳුණු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 ලිඛිත වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සපුරා ගැනේ.

(ii) අයදුම්පත්‍ර සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතිකය ;
3. තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
4. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පළපුරුද්ද තිබේ නම එම සහතික ;
   (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*අයදුම්පත් එවීම* :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2016.03.15 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතුවේ.

පී. ඩී. සෝමලතා,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2016ක් වූ පෙබරවාරි මස 16 වැනි දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ..................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමඟ නම :——————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි ලිපිනය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. විවාහක/අවිවාහක බව :——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
06. උපන්දිනය : අවුරුද්ද :——————.මාසය:——————. දිනය:——————.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ලියාපදිංචි වීමෙන් ද/:——————.
08. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. සා/පෙළ විභාගය :
    සමත් වූ වර්ෂය හා විභාග අංකය :——————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

*වෙනත් සුදුසුකම්* :——————.

09. වෘත්තීය සුදුසුකම් :——————.

10. සේවා පළපුරුද්ද :——————.

(i) දැනට සේවය කරන ආයතනය :——————.

(ii) දැනට දරන තනතුර :——————.

(iii) එම තනතුරට පත්වූ දිනය :——————.

(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර :——————.

——————.

අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පහත ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .................................... මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ .................................................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය මොන ආකාරයෙන් හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————.

ආයතන ප්‍රධානියා.

නම :——————.

පදවි නාමය :——————.

දෙපාර්තමේන්තුව/ආයතනය :——————.

03-206

---

**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | PL2-2006(A) | රු. 12,210 - 130 x 10 -145 x 10 - 160x10 - 170 x 12 -රු. 18,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් සමත්වී තිබිය යුතුය.<br>සහ<br>*(අ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) 3 වන මට්ටමේ (NVQ 3)සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>*(ආ)* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(ඇ)* ජාතික තරුණ සේවා සභාවේ (NVSC) වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(ඈ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | (ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තීයට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ (ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයේ වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. පළපුරුද්ද :- අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02. | සෞඛ්‍ය කම්කරු | 01 | PL1-2006(A) | රු. 11,730- 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | අටවන (08) ශ්‍රේණිය සමත් වී තිබීම (9 වසර) |

*පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(iii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.)
(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
(v) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර 03 අවසානයේ වැඩ පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2016.03.28 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස සභාපති, හම්බන්තොට ප්‍රාදේශීය සභාව, සිසිලසගම, මිරිජ්ජවිල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර "......................................" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය :-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතිකය ;
(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ;
(iv) මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
(v) මෑතක දී ලබාගත් චරිත සහතික 03ක් (ඉන් එක චරිත සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.) ;
(vi) පළපුරුද්ද පිළිබඳ සහතික.

ගාමිණී සමරගුණරත්න,
සභාපති,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව.

2016 පෙබරවාරි මස 23 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය සභාව,
සිසිලසගම - මිරිජ්ජවිල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————.
03. තැපැල් ලිපිනය :————————.
04. දුරකථන අංකය :————————.
05. උපන් දිනය: වර්ෂය:————— . මාසය:————— . දිනය:————— .
06. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු:————— . මාස:————— . දින:————— .
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
09. විවාහක/අවිවාහක බව:————————.
10. ජාතිය :————————.
11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද?, එසේ නම් පරම්පරාවෙන් ද?/ලියාපදිංචි වීමෙන් ද යන වග :————————.
12. අධ්‍යාපන සුදුසුකම් :————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————.
14. ඔබ දැනටමත් හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
(i) දැනට දරන තනතුර :————————.
(ii) එම තනතුරට පත්වූ දිනය :————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද) :———
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේ ද ? :————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් ඒවා බව මා මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ..................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ....................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————————.
තනතුර :————————.
නිල මුද්‍රාව :————————.

03-227

## ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | විදුලි කාර්මික | 01 | පී. එල්. 2-2006 ඒ<br>රු. 12,210 - 10 x 130<br>10 x 145 - 10 x 160 -<br>12 x 170-රු.18,600 | *(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>*(ආ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3 ) සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>*(ඇ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>*(ඈ)* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*(ඉ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*(ඊ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*(උ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>*(ඌ)* අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් අවුරුදු 02කවත් පළපුරුද්ද තිබිය යුතු ය. |
| 02. | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 01 | පී. එල්. 3- 2006 ඒ<br>රු.12,470 - 10 x 130-<br>10 x 145 - 10 x 160-<br>12 x 170 - රු. 18,860 | *(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරක දී සමත්වී තිබිය යුතු ය.<br><br>*(ආ)* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ බලපත්‍රයක් ලබා තිබීම. බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩරය ක්‍රියාකරවීමට හැකි.<br><br>*(ඇ)* තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම.(බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) ;<br>*හා* |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදාළ වන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් (NAITA/ICTAD ) පුහුණුව ලැබූ බවට (NVQ) 4 මට්ටමට නොඅඩු) සනාථ කරන සහතිකය<br>බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩරය ක්‍රියාකරවීමට හැකියාව ඇති පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සළකනු ලැබේ.<br>*(ඉ)* රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් රියදුරකු ලෙස වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතු ය.<br>*(ඊ)* දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>*(උ)* අවම වශයෙන් උස අඩි 05යි අඟල් 2 1/2 ක් විය යුතු අතර, මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩව වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට සුදුසු මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවන් කරනු ලැබූවෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීමට පෙර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල මත අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
3. ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

*විදුලි කාර්මික :*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතයි.
2. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
4. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ය.
5. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූල ව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*බර වාහන යන්ත්‍ර ක්‍රියකරු :*

1. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර කොන්ත්‍රාත් පදනම මත වසර 01ක සේවා කාලයක් සඳහා බඳවා ගනු ලැබේ.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
3. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.
4. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලට ද, මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පවරනු ලබන වෙනත් නියෝග වලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
5. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2016.03.28 වැනි දිනට හෝ එදිනට පෙර ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව, කුරුඳුවත්ත කඩ වීදිය, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ. අයදුම්පත් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු වේ:–

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
4. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතු ය.),
5. ජාතික හැඳුනුම්පත
6. පළපුරුද්ද පිළිබඳ සහතික
7. වලංගු රියදුරු බලපත්‍රය (රියදුරු තනතුර සඳහා)
8. බර වාහන ක්‍රියාකරවීම පිළිබඳ පළපුරුද්ද පිළිබඳ සහතික (රියදුරු තනතුර සඳහා)

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

ඩී. ඒ. රංජනී ප්‍රේමලතා,
ලේකම්,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව,
කුරුඳුවත්ත කඩවීදිය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව***

*..................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. *(අ)* මුලකුරු සමග නම :——————————,
   *(ආ)* සම්පූර්ණ නම :——————————,
2. ලිපිනය :——————————,
3. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
4. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————,
   2016.03.28 වැනි දිනට වයස :——————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————,
6. විවාහක/අවිවාහක බව :——————————,
7. ජාතිය :——————————,
8. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————,
9. අධ්‍යාපන සුදුසුකම් :——————————,
10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————,
11. රියැදුරු තනතුරු සඳහා වන්නේ නම් :——————————,
    *(අ)* රියැදුරු බලපත්‍රයේ අංකය :——————————,
    *(ආ)* නිකුත් කළ දිනය :——————————,

10. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය :——————————,
(එම පත්වීමේ ස්වභාවය : ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග):

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————,

03-250

## මාතර ප්‍රාදේශීය සභාව

මාතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | ජල වැද්දුම්කරු | 01 | රා. ප. ච. 06/2006 අනුව PL2-2006-A රු.12,210 - 10 x130 - 10 x 145-10 x160 - 12 x 170 - රු.18,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත් වීම තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුනතාවන් ලැබීම අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. | * ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.<br>* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.<br>* පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.<br>* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරය කින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව PL1-2006A රු.11,730 - 10 x120 - 10 x 130 - 10 x145 - 12 x 160 - රු.17,600 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වීම. | |
| 03. | සෞඛ්‍ය කම්කරු | 02 | රා.ප.ච. 06/2006 අනුව PL1-2006A රු.11,730 - 10 x120 - 10 x 130 - 10 x145 - 12 x 160 - රු.17,600 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්වීම | |

*වෙනත් :-*

01. මාතර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
02. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
03. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
04. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මාතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
02. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
03. පත්වීම් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
04. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කරන ආකාරය ඃ*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2016.04.19 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මාතර ප්‍රාදේශීය සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය ඃ-

01. උප්පැන්න සහතිකය ;
02. අධ්‍යාපන සහතික;
03. පදිංචිය සහතික කිරීම පිණිස මැතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.);
04. මැතකදී ලබාගත් චරිත සහතික 02ක්;
05. පළපුරුද්ද පිළිබඳ සහතික ;
    මාතර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක් .

පී. ජී. පියල් රණදේව,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2016 පෙබරවාරි මස 25 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභාව - මාතර.

*.......................................... තනතුර සඳහා අයදුම්පත*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග නම) :——————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.

03. ස්ථිර පදිංචි ලිපිනය :——————————.

04. දුරකථන අංකය :——————————.

05. දිස්ත්‍රික්කය :——————————.

06. උපන් දිනය — වර්ෂය :——————————. මාසය :——————————. දිනය :——————————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

10. විවාහක/අවිවාහක බව :——————————.

11. ජාතිය :——————————.

12. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග (එසේ නම් පරම්පරාවෙන්/ලියාපදිංචි වීමෙන් ද) :——————————.

13. අධ්‍යාපන සුදුසුකම් ඃ-

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.

15. ඔබ දැනටමත් මාතර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,

* දැනට දරන තනතුර :——————————.
* එම තනතුරට පත් වූ දිනය :——————————.
* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද) :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ....................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :——————————.

03-312

---

සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු**

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ සීතාවකපුර නගර සභාවේ දනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ අවම සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ පදිංචි ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර (12" x 8" ප්‍රමාණයේ) "ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල" යන ලිපිනයට 2016.03.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| (i) | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු (IIශ්‍රේණිය) | 01 | රු. 12,470-10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (PL-3 -2006A) (මෙම වැටුප් පරිමානයේ 12 පියවර ආරම්භක පියවර වේ) | (i) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම.<br>(ii) තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් හා මගීන් 32 කට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකය ලබා තිබීම.<br>(iii) අවම උස අඩි 05 යි අඟල් 06 ක් විය යුතුයි.<br>(iv) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදල බර යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක් පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, |

| අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.) |
| | | | | (v) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතු ය. |
| 02. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු III ශ්‍රේණිය | 01 | රු. 13,120-10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 (MN1- (2006A) | (i) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම, සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම. |

*03. වයස් සීමාව :-*

(i) බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු (II ශ්‍රේණිය) - අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුයි. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වයස් සීමාවක් අදළ නොවේ.

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු (II ශ්‍රේණිය) - අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ත් 30ත් අතර විය යුතුයි. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වයස් සීමාවක් අදළ නොවේ.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

01. පහත I, II හි සඳහන් සියලුම බඳවා ගැනීම් රා.ප. චක්‍රලේඛ අංක 24/95 අනුව සිදු කරනු ලැබේ.

(i) බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයක ලකුණු මත විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භාරකරු තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදල ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම (ප්‍රශ්න කිහිපයකට වාචිකව පිළිතුරු ලබාදීම.) | 20 | 50% |
| කසල කළමනාකරණය පිළිබඳ ලබා ඇති පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී තිබීම. (සහතිකයකට ලකුණු 05 බැගින්) | 25 | |
| පෞරුෂත්වය | 05 | |

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවාගනු ලැබේ.

(iv) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*06. පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

(iii) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වූ වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

(iv) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

*07. කොන්දේසි :—*

(I) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සීතාවකපුර නගර සභාවේ ලේකම් සතුය.

*08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල සහතික කළ පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය.*

(I) උප්පැන්න සහතිකය;
(II) ජාතික හැඳුනුම්පතේ පිටපත/ගමන් බලපත්‍රයේ පිටපත ;
(III) මෑතකදී (මාස 6ක් තුළ) ලබාගත් චරිත සහතික 02ක් ;
(IV) පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී (මාස 06 තුළ දී) ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන සහිත ග්‍රාමසේවා සහතිකය ;
(V) වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත (බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා පමණි)
(VI) අධ්‍යාපන සහතික සහ වෘත්තීය සහතික;
(VII) පළපුරුද්ද පිළිබඳ සහතික.

ඒ. ආර්. සී. කෞශල්‍යා බණ්ඩාර,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2016 පෙබරවාරි 18 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුර සඳහා බඳවා ගැනීම.*

01. මුලකුරු සමග නම :——————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.

03. ස්ථිර ලිපිනය :——————————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

05. ස්ත්‍රී පුරුෂ භාවය :——————————. විවාහක/අවිවාහක :——————————.

06. උපන් දිනය :——————————.

2016.03.31 දිනට වයස :

අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන් ද? :——————————.

08. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර) :——————————.

(I) සමත් වූ වසර/ශ්‍රේණිය:——————————.

(II) අ.පො.ස. (සා.පෙළ) විභාගය:——————————.

විභාග අංකය :——————————.

විභාග වර්ෂය හා මාසය :——————————.

සමත්වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(III) අ.පො.ස. (උ.පෙළ) විභාගය:——————————.

විභාග අංකය :——————————.

විභාග වර්ෂය හා මාසය :——————————.

සමත්වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

09. වෘත්තීයමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————————.
10. ඔබ ඉල්ලුම්කරන තනතුරේ සේවා පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————————.
11. රිය පැදවීමේ ප්‍රවීණතා සහතිකයේ අංකය හා දිනය :——————————.
12. සේවා පළපුරුද්ද :——————————.
  (I) දැනට සේවය කරන ආයතනය :——————————.
  (II) දැනට දරන තනතුර :——————————.
  (III) එම තනතුරට පත්වූ දිනය :——————————.
  (IV) මීට පෙර සේවය කරන ලද ස්ථාන තිබේනම් එම ස්ථාන හා දරන ලද තනතුරු :——————————.
13. I. තනතුරට අදළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබේද ? :——————————.

II.

| සමත්වූ වර්ෂය සහ මාසය | විෂය | ලකුණු |
|---|---|---|
| | | |
| | | |
| | | |

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :——————————.
15. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෑ*

මෙම ඉල්ලුම්කරු වන ................................ මහතා/මහත්මිය/මෙනවිය, දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.

(නිල මුද්‍රාව යොදන්න.)

දිනය :——————————.

03-279

# පළාත් පාලන නිවේදන

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වන වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත්පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.09.25 දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අති විශෙෂ) පළකරන ලද සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

2016 පෙබරවාරි මස 17 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභා කාර්යාලය.

03-202

---

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බිංගිරිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරය වන, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014.10.01 වන දින අංක 1882/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.01.20 වන දින අංක 1898/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් හා 2015.08.28 වන දින අංක 929/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද නිවැරදි කිරීම්, සංශෝධන සමග වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2015.04.07 දින අනුමත කරන ලද නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට වැළඳගෙන ක්‍රියාත්මක කිරීමට, එකී පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මවිසින් තීරණය කරමි.

ඩබ්. එම්. ඩයන රංජන් වික්‍රමසිංහ,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 29 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේ දී ය.

03-315

**මහරගම නගර සභාව**

නගර සභා ආඥපනත යටතේ (255වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම් හා සභාවේ බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී.

මහරගම නගර සභාව,
2016 පෙබරවාරි මස 23 වැනි දින,

| *අනු. අංකය* | *සැලසුම් අංකය හා දිනය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *උපලේඛනය අනුව සීමාවන්* |
|---|---|---|---|---|---|
| 01 | සැලසුම් අංකය : 2500හි<br>කැබලි අංක 31 සහ 33<br>දිනය : 2004.03.02 | හොරහේන පාරේ සිට<br>ව.අ. 118/31 දක්වා<br>ග්‍රීන්ටෙරස් අතුරු මාර්ගය | මී. 115<br>මී. 10<br>මී. 15 | මී. 6<br>මී. 3.65<br>මී. 4.5 | උතුරට : හොරහේන පාර, කැබලි අංක 2,3,4,8,17,18,19 20<br>දකුණට : කැබලි අංක 10,11,12,13,14,15,16<br>නැගෙනහිර : කැබලි අංක 5,6,7,8,9<br>බටහිරට : කැබලි අංක 16,20,21,23,26 සහ හොරහේන පාර |
| 01 | සැලසුම් අංකය : 8458<br>දිනය : 2003.02.03 | කොට්ටාව, මාළඹේ බාලිකා නිවාස පාරේ සිට<br>ව. අ. 1617/17 දරන නිවාස පිහිටි අතුරු මාර්ගය | මී. 12.5<br>මී. 30.0<br>මී. 56.0 | මී. 8.5<br>මී. 5 සිට 6 දක්වා<br>මී. 6 | උතුරට : ඉඩම් කැබලි අංක 6,7 සහ 8ට යන ඉඩම්<br>දකුණට : බාලිකා නිවාස පාර<br>නැගෙනහිරට : කැබලි අංක 9,10,11,12 යන ඉඩම්<br>බටහිරට : කැබලි අංක 1,2,3,4,5 යන ඉඩම් |

03-287

---

**ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත්පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඒ. රංජනී ප්‍රේමලතා,
ලේකම්,
ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව.

2016.02.10 වැනි දින,
කුරුඳුවත්ත,
ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.08 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව; මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට ගඟඉහල කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

03-278

---

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම් වලින් අදාල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම්දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

ලේකම්,<br>
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

### මාර්ග ලියාපදිංචි කිරීම

| පාරේ නම | ග්‍රාම නිලධාරි වසම | දෙපස ඇති ඉඩම් වම | දකුණ | ආරම්භය | අවසානය | දුර මීටර් | පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| හැරිසන් මාවත (මිරිස්වත්ත සිට අකුරුගොඩ දක්වා යන මාර්ගයේ සිට පුස්සගහවත්තට) | 318 පිටකටුවන | අංක 24 ඉඩම<br>අංක 25 ඉඩම<br>අංක 26 ඉඩම | අංක 18 ඉඩම<br>අංක 19 ඉඩම | මිරිස්වත්ත සිට අකුරුගොඩ දක්වා යන මාර්ගයේ සිට පුස්සගහවත්ත පිටකටුවන | අංක 18 හා අංක 26 යන ඉඩම්වල අවසානය | 47 | 10 |

03-230

---

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ලේකම් දෙලංකාගේ දුර්ගා වික්‍රමසිංහ

වන මම නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කර ප්‍රකාශයට පත්කරනු ලැබූ පරිච්ඡින්න කිරීම කුරුණෑගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 2016.02.08 දිනැති 1039 අංක දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත්පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත්පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ 2015.11.13 දින හා 1940/28 අංකයෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශයට පත්කළ අතර එකී අතුරු ව්‍යවස්ථාව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පරිච්ඡින්න කිරීමට තීරණය කර ඇති තත්වය යටතේ ප්‍රකාශයට පත් වූ නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ 2015.08.28 දින හා 1929/45 අංකයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ අදල පරිච්ඡින්න කිරීම 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවධාන ප්‍රකාරව මා තීරණය කරමි.

03-188

---

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - මැණික්හින්න**

2015.12.11 දින පළකරන ලද අංක 1945 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) විවිධ දැන්වීම් යටතේ 2016 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු හි උපලේඛන අංක 08, 2015.04.30 දින මහා සභා වාර්තාවට අනුව පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

**උපලේඛනය 08**

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු බලගොල්ල ආදාහනාගාරයේ සහ අමුණුගම ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ගාස්තු පහත සඳහන් ආකාරයට වන්නේය :-

| | | |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ සිදුවන ආදාහනයක් සඳහා | රු. 6,000.00 |
| 02. | බල ප්‍රදේශයෙන් පිට සිදුවන ආදාහනයක් සඳහා | රු. 7,500.00 |

අසේල ඒකානායක,
සභාපති,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

2016 පෙබරවාරි මස 17 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

03-231

**මාතර මහා නගර සභාව**

මාතර මහා නගර සභා ආඥපනත

මාතර මහා නගර සභාව විසින් 252 අධිකාරිය වූ මහ නගර සභා ආඥපනතේ 155 වගන්තිය යටතේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති වෙරළ තීරයේ සවස් භාගයේ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයෙහි සඳහන් ව්‍යාපාර සඳහා ගාස්තු අයකිරීමට ද ඒ සඳහා ඔවුන් විසින් බලපත්‍රයක් ලබාගත යුතු බවටද මෙයින් නිවේදනය කරනු ලැබේ.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2016 ජනවාරි මස 13 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

1. කෑම විකිණීම සඳහා නවත්වා ඇති බස් රථයක් වෙනුවෙන් දිනකට රු. 200 බැගින් මාසිකව උපරිමය රු. 5,000 කට යටත්ව අයකළ යුතුය.
2. අයිස්ක්‍රීම් වෑන් රථයක් සඳහා දිනකට රු. 150 බැගින් මාසිකව උපරිමය රු. 4000කට යටත්ව අයකළ යුතුය.
3. අයිස්ක්‍රීම් විකිණීම සඳහා රෝද තුනේ රථයක් වෙනුවෙන් දිනකට රු. 50 බැගින් මාසිකව උපරිමය රු. 1,500 කට යටත්ව අයකළ යුතුය.
4. දිවිනැඟුම මගින් දී ඇති ඩිමෝබට්ටා රථයක් නවත්වා වෙළඳාම් කිරීම සඳහා දිනකට රු. 50 බැගින් මාසිකව උපරිමය රු. 1,500 කට යටත්ව අයකළ යුතු ය.
5. තල්ලු කරගෙන යන කරත්ත සඳහා වෙළඳාම් කිරීම වෙනුවෙන් දිනකට රු. 25 බැගින් මාසිකව උපරිමය රු. 800 කට යටත්ව අයකළ යුතුය.
6. අයිස්ක්‍රීම් විකිණීම සඳහා හෝ වෙනත් වෙළඳාමක් සඳහා යොදා ගන්නා පාපැදියක් වෙනුවෙන් දිනකට රු. 20ක් බැගින් මාසිකව උපරිමය රු. 600කට යටත්ව අයකළ යුතුය.
7. වෙනත් ඕනෑම වෙළඳාමක් සඳහා දිනකට රු. 100 බැගින් මාසිකව උපරිමය රු. 3000 කට යටත්ව අයකළ යුතුය.

03-207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.